ජගත් ජේ එදිරිසිංහ ලියන

# තාරකා විජිතය



14

පර මල් ද වීදුරු කටු ද පිඟන් ගඩොල් පොළොව මත වතුරේ රැඳී තිබුණි. ඒ අතරේ දිලීප දණින් වැටී සිටියේ ය. හිසට තබාගත් දිලීප ගේ අතැඟිලි අතරින් ගලා ආ ලෙයින් ඔහුගේ මුහුණ වැසී යනු නිෂාධි බලා සිටියේ බියපත් දෑසිනි. සිදුවූ සියල්ල අදහාගත නොහැකිව බිය පත් මුවැත්තියක සේ ඈ දෑතින් මුව වසා ගෙන ගල් ගැසී බලා සිටියා ය.

දිලීප අපහසුවෙන් නැගිටින්නට උත්සාහ කළේ ය. නිෂාධි ඉදිරියට පැමිණ ඔහුගේ අතින් අල්ලා ගත්තා ය. ඔහු ඇගේ වාරුවෙන් නැගිට්ටේ ය. ඔහුට පුටුවක වාඩි වන්නට ඈ උපකාර කළා ය.

''ම.. ම.. මං..'' ඈ යමක් කියන්නට තැතනුවා ය. ඔහු අතින් සන් කර ඇය වැළැක්වූයේ ය. වහා මුලුතැන්ගෙට දුවගිය නිෂාධි ප්‍රථමාධාර පෙට්ටියෙන් පුළුන් ගුලියක් ගෙනැවිත් ඔහුගේ හිසේ ලේ ගලමින් තිබූ තැනට තබා තද කළා ය. ඔහු දෑස් පියාගත්වන ම සිටියේ ය.

''සොරි දිලීප..'' නිෂාධි මහත් ආයාසයෙන් කියා ගත්තා ය.

ඔහු කිසිවක් නොකීවේ ය.

''අපි එමර්ජන්සි එකට යමු.. මං ටැක්සියකට කතා කරන්නං..'' ඈ කිවා ය.

''එපා.. '' ඔහු කීවේ ය. ඔහු සිය දකුණතින් ඇගේ අත ඉවත් කළේ ය. වමතින් හිසේ තුවාලය තද කර ගනිමින් ඔහු නැගිට්ටේ ය. මේසය මත වූ කාරයේ යතුර අතට ගත් ඔහු වැනෙමින් දොර වෙත ගමන් කළේ ය.

''ය..න්...න එ...පා... දිලීප..'' නිෂාධි කීවා ය. ඔහු දොර අසළ නැවතුණ නමුත් ආපසු හැරී නොබැලුවේ ය.

'''අයෑම් සොරි... ය..න්...න එ...පා... දිලීප.. ප්ලීස්'' නිෂාධි නැවත කීවා ය.

තවත් මොහොතක් නැවතී සිටි දිලීප ඇය දෙස හැරී නොබලා ම දොරෙන් පිටවූයේ ය. ඔහු ගේ කාරය පණ ගැන්වෙන හඬත් එය පිටත්ව යන හඬත් නිෂාධිට ඇසුණි.

කළ යුතු දෙයක් සිතා ගත නොහැකිව නිෂාධි බොහෝ වේලාවක් කල්පනා කරමින් සිටියා ය. අනතුරුව නිගමනයකට එළැඹුනාක් මෙන් කාමරයට ගිය ඈ ගමන් මල්ලකට ඇඳුම් කීපයක් දමා ගත්තා ය. ගමන් බලපත්‍රය ද බෑගයට දමා ගන්නට ඇයට ඇවැසි විය. එය ඇය තබා තිබූ ස්ථානයේ නොවී ය. සෑහෙන වේලාවක් ගත කර සෙවූ නමුත් එය සොයා ගන්නට ඇයට නොහැකි විය. නිසකව ම දිලීප එය සඟවන්නට ඇත.

අතට අසුවූ පළමු ඇඳුම ම ඇඳගත් නිෂාධි ගමන් මල්ලත් එල්ලාගෙන නිවසින් පිටවුණා ය.

21 වන පිටට

